ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2014 සහ 2015 වර්ෂයන්ට අදාලව ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වාර්ෂික නියාමන ගාස්තුව රු.මිලියන 14.64 ක් වුවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඊට අනුරූපී ගෙවිය යුතු ශේෂයක් දක්වා නොතිබූ අතර මණ්ඩලයෙන් ඍජුව ලැබුණු ශේෂ සනාථ කිරීම් අනුව ද එවැනි ශේෂයක් නොවිණි.	අවශ්‍ය ගැලපීම් සිදුකිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	ලැබිය යුතු ශේෂයන්හි පවතින වෙනස්කම් සම්බන්ධයෙන් විශ්ලේෂණයන් සිදු කර අදාල ආයතනය සමග එකඟතාවයකට පැමිණ නිරවුල් කර ගත යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත			
(i) 3 (1) වගන්තිය	කොමිෂන් සභාව, අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය ඇතිව පත් කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් අතුරෙන් යටත් පිරිසයින් එක් සාමාජිකයෙකු ඉංජිනේරු ක්ෂේත්‍රයේ ද, එක් සාමාජිකයෙකු නීති ක්ෂේත්‍රයේ ද, එක් සාමාජිකයෙකු ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ ද සුදුසුකම් හා පලපුරුද්ද සහිත තැනැත්තන් විය යුතු වුව ද,	කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියට අනුව කොමිෂන් සභාවට සාමාජිකයින් පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකගත්වය ඇතිවයි. පුරප්පාඩු ධූර පිළිබඳ අමාත්‍යංශය වෙත දන්වා ඇත.	පනතේ විධිවිධාන සඳහා අනුගත විය යුතුය.

	මෙම වාර්තාව නිකුත් කරන දින වන විට කොමිෂන් සභාව සාමාජිකයන් සිව් දෙනෙකුගෙන් පමණක් සමන්විත වූ අතර නීති ක්ෂේත්‍රයේ සුදුසුකම් හා පළපුරුද්ද සහිත සාමාජිකයෙකු ඉහත සාමාජිකයන් අතරට ඇතුලත්ව නොතිබුණි.		
(ii) 3 (2) වගන්තිය	කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් ඇති වී මාස 03 ක් ඇතුලත පුරවනු ලැබිය යුතුය . 2024 ජූලි මාසයේදී, ඒ වන විට පැවති කොමිෂන් සභාවේ ධූර කාලය අවසන්ව තිබූ අතර 2024 නොවැම්බර් 26 දින නව කොමිෂන් සභා සාමාජිකයින් පස්දෙනෙකු පත් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් සාමාජිකයන් දෙදෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර මෙම වාර්තාව නිකුත් කරන දින වන විටත් ඉන් එක් පුරප්පාඩුවක් සම්පූර්ණ වී නොතිබුණි.	කොමිෂන් සභා පනතේ වන 3 වගන්තියට අනුව කොමිෂන් සභාවට සාමාජිකයින් පත්කරනු ලබන්නේ ම වරයා විසින් ආණ්ඩුක්‍රඅමාත්‍ය ව්‍යවස්ථා සභාවේ එකගත්වය ඇතිවයිපුරප්පාඩු ධූර පිළිබද . .ශය වෙත දන්වා ඇතඅමාත්‍යං	කොමිෂන් සභාවේ කටයුතු ඵලදායි ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා පනතේ විධිවිධාන සඳහා අනුගත විය යුතුය.
(iii) 16 සහ 17 වගන්තිය	ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් කර්මාන්ත එනම් විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළයුතු වුවත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වර්ෂ 22 කට වැඩි කාලයක් මුළුල්ලේ ඛණිජ තෙල් හා ජලය යන කර්මාන්ත කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීමට නොහැකි වී තිබුණි. එබැවින් කොමිෂන් සභා පනතේ 14(2) වගන්තියෙහි සඳහන් අරමුණු ඉටු කර ගැනීමේදී මහජන උපයෝගිතා කර්මාන්ත අතරින් විදුලි බල කර්මාන්තයට අදාල	මේ බව අදාල අමාත්‍යාංශ දැනුවත් කර සාකච්චා ද පවත්වා ඇති අතර තවමත් අදාල නීති කෙටුම්පත් කර අවශ්‍ය බලතල ජල හා ඛනිජ තෙල් ක්ෂේත්‍ර සම්බන්ධව කොමිෂන් සභාවට ලබා දී නොමැත .	ඛනිජතෙල් හා ජලය නියාමනය කිරීමට අදාළ නීතිමය රාමුව සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදු කළ යුතුය.

		කාර්යයන් පමණක් ඉටු කල හැකිව තිබුණි .		
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
(i)	මුදල් රෙගුලාසි 103(1), සහ 104(4)	2023 වර්ෂයේදී කොමිෂන් සභාවේ එවකට සිටි සභාපති වෙත ලබා දී තිබූ රු .5,500,000 ක් වටිනා මෝටර් රථය 2023 දෙසැම්බර් 11 දින මූලික විමර්ශන වාර්තා අනුව අදාල රියදුරු බීමතින් නොසැලිකිලිමත්ව රිය ධාවනය කිරීම මත හදිසි අනතුරකට ලක්ව තිබූ අතර ඊට අදාල පූර්ණ වාර්තාව 2025 මාර්තු මස අවසානය වන විටත් ඉදිරිපත් කර නොතිබුණිතවද ., මෙම අනතුර හේතුවෙන් වාහනයට සිදුවූ අලාභය වූ රු .2,185,052 ප්‍රතිපූර්ණය කිරීමට රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කර තිබූ අතර එම අලාභය හා වාහනය නැවත කොළඹට රැගෙන ඒමට වැය වූ රු2.2,000 ක් මෙම වාර්තාව නිකුත් කරන දින වන විටත් අදාල පාර්ශව වෙතින් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පරීක්ෂණ අනුව අදාල රියදුරු අලාභය සඳහා වගකිව යුතු බවට තහවුරු වී ඇති අතර නීති කටයුතු ආරම්භ කිරීමට දැනටමත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට අදාල අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කල යුතුය.
(ii)	(ii) මුදල් රෙගුලාසි 1645 (ආ) (ඇ), 1646 සහ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 5.1 ඡේදය	දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ ධාවන සටහන් සෑම මසක් අවසන් වීමෙන් පසු ඊලග මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, කොමිෂන් සභාව විසින් ඉහත අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. තවද, චක්‍රලේඛ ප්‍රකාරව වාහනයේ ඉන්ධන ප්‍රමාණය හා ධාවනය කරන ලද දුර ප්‍රමාණය දිනපතා දෛනික ධාවන සටහන් පත්‍රයේ සටහන් කර තුලනය කලයුතු	දැවෙන ඉන්ධන ප්‍රමාණ තුලනය, රියදුරන් මාරු කිරීම හා ගමන් වියදම් පිළිබඳ සාරාංශ ධාවන සටහන්හි යාවත් කාලීන කිරීම ආරම්භ කරන ලදී. ඉදිරියේදී සාරාංශ ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.

	වුවත් කොමිෂන් සභාව සතු වාහන වලට අදාලව වැයවූ ඉන්ධන ප්‍රමාණය තුලනය කර දක්වා නොතිබුණි.		
(ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අතිරේක 38 මාර්ගෝපදේශ 9.3.1 (ආ)	මාර්දේගෝපදේශය ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන මෝටර් වාහන අළුත්වැඩියාවන් සඳහා අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු ලෙස දක්වා තිබුණ ද, කොමිෂන් සභාව සතු Peugeot 408 වර්ගයේ මෝටර් රථය සඳහා 2024 මාර්තු මාසයේදී සිදු කර තිබූ රු.633,639 ක අළුත්වැඩියාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන කොමිෂන් සභාවේ අනුමැතිය මත පමණක් සිදු කර තිබුණි.	වර්තමානයේ වාහන අළුත් වැඩියා සඳහා නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව අදාල අනුමැතිය ලබාගැනේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඈ) 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය- රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත 3.1 හා 3.2 ඡේද සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 63 වගන්තිය			
	(i) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය, බඳවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටිය හා වැටුප් ව්‍යුහය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන නොතිබුණි. එලෙස මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතීන් ලබා ගැනීමකින් තොරව සිය ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත දීමනා	2002 අංක 35 දරණ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල වැටුප් හා අනිකුත් ප්‍රතිලාභ තීරණය කිරීමේ බලය කොමිෂන් සභාව සතු වේ.	පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ ප්‍රතිපාදනයන් සමගද අනුකූල විය යුතුය.

	වර්ග 08 ක් යටතේ සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.42,084,105 ක් වූ ගෙවීම් කර තිබුණි.		
	(ii) කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන් සඳහා රු. මිලියන 8 ක උපරිම සීමාව හා අවුරුදු 15 කාල සීමාවට යටත්ව නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය සඳහා මෙන්ම උපරිමය රු. මිලියන 5 ක සහ ආපසු ගෙවීමේ කාල සීමාව අවුරුදු 5 කට යටත්ව ලබා දෙන වාහන ණය යෝජනා ක්‍රමයට භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව නිලධාරීන්17 දෙනෙකු විසින් ලබා ගන්නා ලද නිවාස හා දේපළ ණය වෙනුවෙන් රු.4,112,065 ක්ද, නිලධාරීන් දෙදෙනෙකු විසින් ලබා ගන්නා ලද වාහන ණය වෙනුවෙන් රු.77,352 ක්ද, කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ පොලී වශයෙන් ප්‍රතිපූර්ණය කර තිබුණි.	මෙම පහසුකම කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. ණය ලබාදෙන අරමුණට අනුව අදාල දේපල පිළිබඳ තහවුරු කරගැනීමට පියවර ගෙන ඇත. 2002 අංක 35 දරණ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල වැටුප් හා අනිකුත් ප්‍රතිලාභ තීරණය කිරීමේ බලය කොමිෂන් සභාව සතු වේ.	වාහන ණය යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට අනුකූල වන පරිදි කොමිෂන් සභාව විසින් ණය ලබාදිය යුතුය.
(ඉ) 2022 ජනවාරි 14 දිනැති අංක PED - 1/2015(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමි නිලධාරීන්ට ගෙවිය යුතු ඉන්ධන දීමනාව ඉක්මවා කොමිෂන් සභාවේ අනුමැතිය මත පමණක් ඉන්ධන දීමනාව ගෙවා තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් හා අධ්‍යක්ෂක තනතුරු	2002 අංක 35 දරණ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල වැටුප් හා අනිකුත් ප්‍රතිලාභ තීරණය කිරීමේ බලය කොමිෂන් සභාව සතු වේ.	පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවල විධිවිධාන වලට අනුකූල විය යුතුය.

	දරන නිලධාරීන් 10 දෙනෙකුට චක්‍රලේඛය ප්‍රකාරව හිමි නිල ඉන්ධන දීමනාව ඉක්මවා සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන ලීටර 4980 ක් සඳහා රු.1,724,310 ක් ගෙවා තිබුණි.		
(ඊ)2015 මැයි 25 දිනැති අංක 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3 ඡේදය සහ අංක 01/2015 (i) හා 2016 ඔක්තෝබර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වන ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව වාහන දීමනාව රු. 50,000 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාවේ නිලධාරීන් 19 දෙනෙකුට රු.60,000 බැගින් මාසිකව නිල වාහන දීමනාව ගෙවා තිබීම හේතුවෙන් එම නිලධාරීන්ට වැඩිපුර ගෙවා තිබූ වාහන දීමනාව රු.2,245,000 විය. ඊට අමතරව වාහන දීමනා ලබා ගන්නා නිලධාරීන් 09 දෙනෙකුට කොමිෂන් සභාව විසින් මාසිකව රු.20,000 බැගින් ලබා දී තිබූ අතර එලෙස ලබා දුන් මුළු රියදුරු දීමනාව රු.2,090,000 ක් විය.	2002 අංක 35 දරණ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල වැටුප් හා අනිකුත් ප්‍රතිලාභ තීරණය කිරීමේ බලය කොමිෂන් සභාව සතු වේ.	පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවල විධිවිධාන වලට අනුකූල විය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 28.3 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 22.9 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 51.2 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආයෝජන ආදායම් සියයට 33 කින් පහල යාම සහ මෙහෙයුම් වියදම් සියයට 13 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ අඩුවීම පහත දැක්වේ.

විස්තරය	විචලනය		විචලනය සඳහා හේතුව
	වැඩිවීම(අඩුවීම)/ රු.මිලියන	ප්‍රතිශතය (%)	
වෙනත් ආදායම්	(44)	33	ආයෝජන ආදායම් පහල යාම.
මෙහෙයුම් වියදම්	23	13	ලැබිය යුතු නියාමන ගාස්තු සඳහා හානිකරණය සඳහා වෙන් කිරීම් ඇති කිරීම

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොමිෂන් සභාව විසින් 2021 හා 2022 වර්ෂයන්හිදී පරිගණක පද්ධති සංවර්ධනය කිරීම් හා වැඩිදියුණු කිරීම් සඳහා වූ සේවා සැපයුම් 09 ක් විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව ආයතන 04 කට ලබා දී තිබූ අතර එම පද්ධතීන් සියල්ලම 2022 වර්ෂය අවසානය වන විට නිම කල යුතුව පැවතුණි. කෙසේ වුවද, රු. 1,129,400 ක් වූ පද්ධති සංවර්ධන ප්‍රසම්පාදනයන් 2 ක් අතරමග නතර කර තිබූ අතර රු. 2,513,502 ක් වූ පද්ධතීන් 4 සම්පූර්ණ කොට අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි.	PUCSL Intranet, Technician Information System සහ Procurement workflow System යන පද්ධති මෙම වසර අවසානයට පෙර වැඩකටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ . HRD System Modification මේ වන විට වැඩ කටයුතු අවසන් වී ඇත . Business Intelligence Systemනව - තාක්ෂණයෙන් නිශ්පාදිත පද්ධති නිර්මාණය වී ඇති බැවින් මෙම පද්ධති මේ සඳහා කල .සංවර්ධනය නවත්වන ලදි ගෙවීම් නැවත අයකර ගැනීමට අදාල .සාකච්චා මේවන විට ආරම්භ කර ඇත Modifying DRS System - මෙම පද්ධතිය අළුතින්ම නිර්මාණය කරන බැවින් පැවති පද්ධතිය වැඩිදියුණු කිරීම මේ වන විට නවතා ඇත . එම පද්ධති වැඩි දියුණු කිරීම සඳහා ගෙවන ලද මදල් අයකර ගැනීමට කටයුතු .සිදු කරනු ලැබේ	- විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් මත කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කළ යුතුය. - කොන්ත්‍රාත් ප්‍රමාදයන් වැලැක්වීමට සමීප අධීක්ෂණයක් සිදු කල යුතුය. - පද්ධති සංවර්ධනය නවතා ඇති කොන්ත්‍රාත්තු වෙනුවෙන් ගෙවූ මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් කල්ඉකුත් වී තිබූ ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම, ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්ගලික) සමාගම, සහ ඒසියා පවර් (පුද්ගලික) සමාගම යන	අදාල නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපතිතුමා වෙත යොමුකර ඇත . යාමාර්ග ගනු නීතිපති උපදෙස් මත ඉදිරි ක්‍රි .ඇත	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් කල්ඉකුත් වී තිබුණු ආයතනයන්ගෙන් විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී

ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගෙන් 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පිලිවෙලින් අවස්ථා 5, 4, හා 2 කදී මූලික විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් දිර්ඝ කරමින් කෙටිකාලීන පදනමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු. මිලියන 95,557 ක් වටිනා ගිගා වොට් පැය 3,290 ක් විදුලිය මිලදී ගෙන තිබුණි. සංශෝධිත 2009 අංක 30 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 07 වගන්තිය ප්‍රකාරව විදුලිය උත්පාදනය සඳහා වලංගු බලපත්‍රයක් තිබිය යුතු වුවද, ඒ වන විට ඉහත සමාගම් සතුව වලංගු බලපත්‍රයක් නොතිබුණි. එසේම පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලිය උත්පාදනය සඳහා ඉහත කාලපරිච්ඡේදයට අදාලව එම සමාගම් වලට බලපත්‍රයක් ප්‍රදානය කර නොතිබුණි. එසේ වුවද, කොමිෂන් සභාව විසින් උක්ත පනතේ 7 වන වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම සමාගම්වලට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		ලංකා විදුලිබල පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුතු මිල නියම කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම, හා නියාමන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම ඇතුළු අරමුණු 06 ක් පෙරදැරිව කොමිෂන් සභාව විසින් 2016 මැයි මස නියාමන ගිණුම් පිළියෙල කිරීම සඳහා වූ මාර්ගෝපදේශය හඳුන්වා දී තිබූ අතර 2018 ජනවාරි මස එම මාර්ගෝපදේශ සංශෝධනය කර තිබුණි. එම සංශෝධිත	CEB නියාමන ගිණුම් ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වශයෙන් බලපත්‍ර ලාභින්)CEB) පෙන්වා දුන්නේ ඔවුන්ගේ ERP පැකේජය නියාමන ගිණුම් සෑදීමට යාවත්කාලීන නොකර ඇති බැවින්, නියාමන ගිණුම් සකස් කිරීමට ප්‍රාථමික)manual) ක්‍රම භාවිතා කරන අතර ඒ සඳහා කාලය ගත වීමයිකෙසේ . නමුත් නියාමන ගිණුම් නොමැති හෝ ප්‍රමාද වී ඇති අවස්ථාවන්හි කොමිෂන් සභාවේ අරමුණ ඉටුකර ගැනීම සඳහා බලපත්‍ර	නියාමන මාර්ගෝපදේශ හඳුන්වා දීමේ අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි බලපත්‍ර ලාභීන්ගෙන් අදාළ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාදයකින් තොරව ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

මාර්ගෝපදේශයේ 2.4 ඡේදය අනුව බලපත්‍රලාභීන් විසින් අදාළ ගිණුම් වර්ෂය අවසන්ව මාස 5 ක් ඉක්මවීමට පෙර විගණිත නියාමන මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ. කෙසේ වුවද, විගණනයට ලද තොරතුරු අනුව, ජනන ,සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ බලපත්‍රලාභී ලංකා විදුලිබල මණ්ඩලය 2021, 2022, හා 2023 වර්ෂ සඳහා වූ නියාමන මූල්‍ය ප්‍රකාශන පිළිවෙලින් 2023 අගෝස්තු 14, 2024 ජනවාරි 26 හා 2024 දෙසැම්බර් 13 යන දිනයන්හිදී එනම් වර්ෂයක, මාස 08 ක හා මාස 06 ක ප්‍රමාදයක් සහිතව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ අතර බෙදාහැරීමේ බලපත්‍රලාභී ලංකා විදුලි පුද්ගලික සමාගම මේ දක්වා ඉහත නියාමන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.	ලාභීන්ගේ දත්ත අවශ්‍ය ආකෘතියට ගෙන්වා ගැනීමක් සිදු කරනු ලබයි .	

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2014 දෙසැම්බර් 15 දින රු.5,750,000 ක වටිනාකමකට මිලදීගෙන තිබූ 2024 දෙසැම්බර් 31 දිනට රු. 7,200,000 ක ප්‍රත්‍යාගණිත වටිනාකමින් යුතු PEOGEOT 408 වර්ගයේ මෝටර් රථය 2023 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වර්ෂ 2කට ආසන්න කාලසීමාවක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.	මෙම රථය නැවත ධාවන තත්වයට ගෙන ඒම සඳහා අදාල ඇස්තමේන්තු සහ තාක්ෂණික තත්වය පිළිබඳ වාර්තා ලබාගෙන ඇති අතර මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ විෂය දැනුමැති විශේෂඥයෙකුගේ ස්වාධීන නිර්දේශද ලබාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව අලුත්වැඩියාවන් නිමාකර මේ වන විට භාවිතයට ගෙන ඇත .	වත්කම් කාලීනව ප්‍රශස්ථ ලෙස උපයෝජනයට කටයුතු කළ යුතුය.

3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) කොමිෂන් සභාව තම කාර්යය හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී ඇතැම් අවස්ථාවල උපදේශන සේවා ලබා ගෙන තිබූ අතර පහත සඳහන් අවස්ථාවන්හිදී		

	අදාල කාර්යය නිම කිරීමේ ගිවිසුම් ගත කාලයට සාපේක්ෂව දීර්ඝ කාලීන ප්‍රමාදයන් නිරීක්ෂණය විය.		
(i)	ඛනිජ තෙල් ඉන්ධන මිශ්‍ර කිරීම අනාවරණය කර ගැනීමේ ක්‍රියා පටිපාටියක් සකස් කිරීමට (Formulation of procedure for detecting Adulteration of petroleum fuels) කොමිෂන් සභාව රු.4,051,750 ක වටිනාකමක් සඳහා 2021 අගෝස්තු මස කොළඹ විශ්ව විද්‍යාලයේ පරිඝණක (University of Colombo School of Computing) ආයතනය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. අදාළ ගිවිසුම ප්‍රකාරව නියමිත කාර්යය කොන්ත්‍රාත්තුව ප්‍රදානයෙන් සති 30 ක් ඇතුලත එනම් 2022 අප්‍රේල් නිම කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය අවසානය වන වසර 02 ක හා මාස 07 ක කාල ප්‍රමාදයකින් පසුව 2024 දෙසැම්බර් මාසයේදී අවසන් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.	මෙම කර්තව්‍යයේ අවසන් වාර්තාව ලැබී ඇත .	උපදේශන සේවා වලට අදාළ කාර්යයන් ගිවිසුම්ගත කාල සීමාව තුළ අවසන් කර අදාළ අරමුණු කරා ළඟා වීමට කටයුතු කළ යුතුය.
(ii)	රට තුළ භාවිතා කරන ලද ලිහිසි තෙල් වලින් බොහාමයක් ඉතා අපරික්ෂාකාරී ලෙස පරිසරයට මුදාහරිමින් පැවතීම නිසා පරිසර දූෂණය සිදු වන බැවින් භාවිතා කරන ලද ලිහිසි තෙල් පිළිගත් ක්‍රමවේද අනුගමනය කරමින් බැහැර කිරීම මඟින් පරිසර සංරක්ෂණයට දායක වීමේ ප්‍රමුඛ අභිප්‍රාය ඇතිව කොමිෂන් සභාව 2020 ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් අංක AP20/CP/LIC/08 යටතේ ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලිහිසි තෙල් එකතු කිරීම, ප්‍රතිචක්‍රියකරණය හා බැහැර කිරීම් සම්බන්ධ යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා සැලසුම් කර තිබුණි. මෙම කාර්යය සඳහා කොමිෂන් සභාව පෞද්ගලික උපදේශන සමාගමක් සමඟ රු.4,796,000 ක වටිනාකමක් සඳහා 2022 පෙබරවාරි 25 දින ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුම් දින සිට මාස 08 ක් තුල අදාළ කාර්යය නිම කිරීමට එකඟ වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගිවිසුම්ගත දින සිට වසර 02 කට වැඩි කාලයක් ගතව තිබුණද, ඉහත කාර්යය සම්පූර්ණ කරගෙන නොතිබුණි.	සංශෝධිත කෙටුම්පත් අවසන් වාර්තාව සම්පූර්ණ කර ඇති අතර, එහි අඩංගු සොයාගැනීම් සහ නිර්දේශ රජයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ට ඉදිරිපත් කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.	උපදේශන සේවා වලට අදාළ කාර්යයන් ගිවිසුම්ගත කාල සීමාව තුළ අවසන් කර අදාළ අරමුණු කරා ළඟා වීමට කටයුතු කළ යුතුය.

(iii)	වහල මත සූර්ය විදුලි උත්පාදනය සම්බන්ධව තෙවන පාර්ශවීය ආයෝජන සඳහා පහසුකම් සැලසීමට අදාළ ගිවිසුම් ව්‍යුහය සමාලෝචනය හා සංශෝධනය කිරීම (Review and revise the contractual structure relating to rooftop solar electricity generation to facilitate third party investments) සඳහා රු. 3,900,000 ක වටිනාකමකට පෞද්ගලික ආයතනයක් සමඟ කොමිෂන් සභාව 2022 දෙසැම්බර් 01 දින ගිවිසුමකට එළඹ තිබූ අතර අදාල කාර්යය ගිවිසුම්ගත දින සිට සති 20 ක් එනම් 2023 මැයි 01 දින වන විට නිම කිරීමට එකඟව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගිවිසුම් ගත නිම කිරීමේ දිනෙන් වසර 1 1/2 කට වැඩි කාලයක් ගතව තිබුණද, අදාල කාර්යය නිම කරගෙන නොතිබුණි.	මෙම කාර්යය මේ වන විට නිම වී ඇත අවසන් වාර්ථාවට අවශ්‍ය . කොමිෂන් සභාවේ අනුමැතිය .ලැබී ඇත	උපදේශන සේවා වලට අදාළ කාර්යයන් ගිවිසුම්ගත කාල සීමාව තුළ අවසන් කර අදාළ අරමුණු කරා ළඟා වීමට කටයුතු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කොමිෂන් සභා කාර්ය මණ්ඩලය 76 න් සේවකයින් 47 ක් සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර අනුමත තනතුරු සංඛ්‍යාවෙන් තනතුරු 28 කට අදාලව සේවකයින් 29 ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු විශේෂ අනුමැතියක් ලබා ගෙන පිරවීමට හෝ තනතුරු වල අවශ්‍යතාවය කාලීනව ඇගයුම් කර අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	මෙම වර්ෂය තුලදී සේවක පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන ඇත . තාවය කාලීනව තනතුරු වල අවශ්‍ය ව ඇගයුම් කර අනුමත සේවක සංඛ්‍යා සංශෝධනය මේ වසර තුලදී සිදු කෙරේ.	අනුමත කාර්ය මණ්ඩල අවශ්‍යතාවය නැවත සමාලෝචනය කල යුතුය.

4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	කොමිෂන් සභාවේ 2024 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අංශ 12 ක් යටතේ වටිනාකම රු.169,584,508 ක් වූ ක්‍රියාකාරකම් 100 කින් සමන්විත වූ අතර විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඉන් අංශ 09 කට අදාල ක්‍රියාකාරකම් 92 ක් සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දිනට කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	2024 වර්ෂය තුල ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කර තිබූ ජල පාරිභෝගිකයන් සඳහා සාධාරණ මිළක් ඇති කිරීම (Fair price for water consumers) යන කාර්යය සමාලෝචිත වර්ෂය අවසානය වන විට අපේක්ෂිත ප්‍රගතිය අත්කර ගෙන නොතිබුණි.	ජලසේවා නියාමනයට නෛතික පසුබිම වසර 2024 තුලදි සකස්නොවූ නිසා මෙම ම සහ වෙළඳපොඅයක්‍රල ක්‍රමවේද සකස්කර ජනතාවට සාධාරණ ගාස්තු ක්‍රමයක් ලබාදීමට තිබූ අවස්ථාව අහිමි විය.	වඩාත් තාත්වික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාවට නැංවීම තුලින් අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට කටයුතු කල යුතුය.
(ii)	කාර්ය අංක AP24/TEA/01/CP/01 යටතේ විදුලිබල මණ්ඩලය සතු ජනන බලාගාරයන්හි විදුලි මිළට ගැනීම් ගිවිසුම්වල ඇතුළත් වන පිරිවැය පරාමිතීන් සැකසීම සහ අනුමත කිරීම සඳහා විදුලිබල උත්පාදන පිරිවැය මිණුම් සලකුණු කිරීම (Electricity generation cost benchmarking in order to set and approve cost parameters those goes into PPAs of CEB generation plants) සහ කාර්ය අංක AP24/LIC/CP/01/06 යටතේ බලපත්‍රලාභීන් සඳහා කොමිෂන් සභාව වෙත තොරතුරු ඉදිරිපත් කිරීමට ස්වාධීන දත්ත ඉදිරිපත් කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම (Development of independent Data Submission System for Licensees to submit information to the PUCSL) යන කාර්යයන් 2024 වර්ෂය තුල නිම කිරීමට අපේක්ෂා කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට පිළිවෙලින් සියයට 20 ක සහ සියයට 25 ක ඉතා අඩු ප්‍රගතියක් පමණක් අත්කර ගෙන තිබුණි.	AP/24TEA/01/CP/01- දත්ත නොමැතිකම හේතුවෙන් අභ්‍යන්තර සම්පත් හෝ දත්ත භාවිතයෙන් Benchmarking අධ්‍යයනයන් සිදු කළ නොහැකඑබැවින් ., SAREP (USAID අරමුදල් සහිත (වැඩසටහනේ තාක්ෂණික සහ◌ාය ඇතිව එය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ද SAREP වැඩසටහන නවතා දමන ලදී . AP24/LIC/CP/01/06 - පොදු දත්ත ගබඩාවක් මත පදනම් වූ අඩු-කේත හෝ කේත නොමැතිව පද්ධතිය සැලසුම් කිරීමට ගත් උත්සාහයන් හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද විය. කෘතිම බුද්ධිමය හැකියාවන් සමඟ සම්බන්ධ කළ හැකි පද්ධතියක් සඳහා නව පිරිවිතරක් සැකසීමට	වඩාත් තාත්වික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාවට නැංවීම තුලින් අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට කටයුතු කල යුතුය.

	තීරණය කරන ලද අතර අභ්‍යන්තර සාකච්ඡා මඟින් සංවර්ධකයාට වැඩි ස්වාධීනත්වයක් ලබාදීම, සහ API මත පදනම් වූ දත්ත ලබා ගැනීම වැනි කෘතිම බුද්ධිමය විශේෂාංග ඇතුළත් කිරීම වැනි වෙනස්කම් හේතුවෙන් ටෙන්ඩර් ලේඛනයට සම්පූර්ණ සංශෝධනයක් අවශ්‍ය වීම තවත් ප්‍රමාදයන්ට හේතු විය. ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැන් අවසන් අදියරේ ඇති අතර, පද්ධතිය සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම නොබෝ දිනකින් සිදුකිරීමට බලාපොරොත්තු වේ.	
(iii) 2020, 2021 සහ 2023 වර්ෂවල ක්‍රියාකාරී සැලැස්ම තුළින් හඳුනාගෙන අදාළ වර්ෂ තුළදීම නිම කිරීමට සැලසුම් කරන ලද ආනයනික හා දේශීය ලිහිසිතෙල් මත බඳු පැනවීමේ ව්‍යුහය පිළබඳ රජයට උපදෙස් සැපයීම (AP20/RA/CP/04), ඛනිජ තෙල් අංශය සඳහා ආයතනික ආපදා කළමනාකරණ සැලසුමක් සකස් කිරීම (AP21/RA/CP/01), විදුලිබල අංශය සඳහා ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම (AP23/LIC/CP/LIC/16), යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසානය වන විට හෝ නිම කිරීමට අපොහොසත්ව තිබූ අතර ඒවායෙහි ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.	AP20/RA/CP/04 බලශක්ති අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව මෙම ක්‍රියාකාරකම ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණිඑහෙත් ., වෙළඳපොළ සහභාගිවන්නන් විසින් අවශ්‍ය දත්ත ලබා නොදීම හේතුවෙන් එය ප්‍රමාද විය . AP21/RA/CP/01 ලංකා ඛනිජ තෙල් සංස්ථාව (පිරිපහදුව) විසින් අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම ක්‍රියාකාරකම ඉදිරියට ගෙන යාමට නොහැකි විය. AP23/LIC/CP/LIC/16 ල.වි.බ.ම. විසින් අවශ්‍ය තොරතුරු ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකිවී ඇත.	වඩාත් තාත්වික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාවට නැංවීම තුලින් අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට කටයුතු කල යුතුය.